රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 10/2015 (II)

මගේ අංකය : CS/SLAS/AMEN/MINUT(III වෙළුම)
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
2016 මාර්තු මස 31 වෙනි දින.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වූ පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය හා II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වීම සඳහා සහන ලබා දීම

ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වූ 2015.04.23 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 10/2015 හි 02 ඡේදයෙහි අනු අංක: I. පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

02 කාර්යක්ෂමතා කඩඉම්

I. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන්ට අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත පරිදි නොපැවැත්වීම නිසා ඇති වන පරිපාලනමය ගැටලු සම්බන්ධයෙන් පහත සඳහන් සහන ලබාදීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත.

i. අංක: 1842/2 හා 2013.12.23 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළවූ නව ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථාවේ සඳහන් පළමු සහ දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සම්පූර්ණ කිරීම සඳහා විභාග වාර 06 ක් ලබාදීමටත්,

ii. අංක: 1419/3 හා 2005.11.14 දිනැති ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථාවේ දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කිරීම සඳහා උක්ත සේවා ව්‍යවස්ථාව යටතේ බඳවා ගන්නා ලද නිලධාරීන්ට විභාග අවස්ථා 12 ක සහනයක් ලබාදීමටත්,

iii. අංක: 1419/3 හා 2005.11.14 දිනැති ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථාවේ සඳහන් පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කිරීම සඳහා උක්ත සේවා ව්‍යවස්ථාව යටතේ බඳවා ගන්නා ලද නිලධාරීන්ට විභාග අවස්ථා 06 ක සහනයක් ලබාදීමටත්,

මෙම සහන අදාල වන්නේ නිලධාරියාගේ පත්වීම් හෝ උසස්වීම් දින සිට පවත්වනු ලැබූ විභාග වාර / අවස්ථා ගණන අනුව වේ.

02. මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකඟතාවය ඇතිවය.


ජේ. දඩල්ලගේ
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය.